**e-නැණපියස වැඩ සටහන**

**දියමන්ති ව්‍යාපෘතිය**

**සාමාන්‍ය පාඩම් - 6**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම /ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 6.2.2.මයිකල් ආන්ජිලෝගේ නිර්මාණ අගයමු (II) |

**ඉගෙනුම් අත්වැල**

## ආදම් මැවීම (The Creation of Adam)



- මයිකල් ආන්ජලෝ විසින් රෝමයේ වතිකානු නගරයේ සිස්ටයින් දෙව්මැදුරේ නිර්මාණය කරන ලද වියන් තල සිතුවම් අතරින් වැදගත් නිර්මාණයකි.
- ප්‍රෙස්කෝ සිකෝ ක්‍රමය භාවිත කර ඇත.
- දෙවියන් වහන්සේගේ රුව සාමාන්‍ය මිනිස් රුවක ස්වරූපයෙන් දැක්වීම මෙහි ඇති විශේෂත්වයකි.
- දේවදූතයන් සමඟ සිටින දෙවියන් වහන්සේ ආදම් වෙත ඇඟිල්ල දිගු කරගෙන සිටින අතර ආදම් විසින් දෙවියන් වහන්සේ වෙත අත දිගුකර සිටින ආකාරය නිරූපණය වේ.
- දෙවියන් වහන්සේ මහලු ස්වරූපයෙන් ද ආදම් තරුණ ලෙසද දක්වා ඇත.
- ආන්ජිලෝගේ මූර්ති වල දැකිය හැකි ශක්ති සම්පන්න හා ජවසම්පන්න බව මෙම සිතුවම් වලින් ද මැනවින් දක්වා ඇත.

## අන්තිම විනිශ්වය (Last Judgment)



- මෙම සිතුවම රෝමයේ වතිකානු නගරයේ සිස්ටයින් දෙව්මැදුරේ අල්තාරය පිටුපස බිත්තියේ නිර්මාණය කර ඇත
- ලොව විශාලතම ප්‍රෙස්කෝ සිකෝ සිතුවම ලෙස සැලකෙන මෙය අඩි 48 x 44 ප්‍රමාණයෙන් යුක්ත ය.
- සිතුවම ප්‍රධාන කොටස් තුනකට බෙදා එය ස්වර්ගය, මනුලොව හා පරලොව ලෙස සංකේතාත්මකව නිරූපණය කර ඇත.
- ශිල්පියාට ආවේණික වූ ස්වභාවික හා තාත්වික ශෛලිය ලක්ෂණ අනුව සිතුවම සංරචනය කර ඇත.
- මිනිස් රූප වල කායික ලක්ෂණ, ක්‍රියාකාරී ලක්ෂණ සමග හැඟීම් ප්‍රකාශනය මැනවින් දක්වා ඇත .

**ක්‍රියාකාරකම**

1. ආදම් මැවීම සහ අන්තිම විනිශ්වය යන සිතුවම් නිර්මාණය කර තිබෙන්නේ කොහේද ?කවුරුන් විසින්ද?
2. ලොව විශාලතම ප්‍රෙස්කෝ සිකෝ සිතුවම කුමක්ද ?
3. ආදම් මැවීම සහ අන්තිම විනිශ්වය නම් වූ නිර්මාණ පිළිබඳ පහත කරුණුද ඇතුළත් වන සේ සරල විස්තරයක් ලියන්න (ශිල්පියා, නිර්මාණය කර ඇති ස්ථානය, ශිල්ප ක්‍රමය, වර්ණ භාවිතය,හැඟීම් ප්‍රකාශනය,තේමාව)

**පැවරුම -මයිකල් ආන්ජලෝගේ සිතුවම් පිළිබඳ වැඩිදුර තොරතුරු එකතු කරන්න**